# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,334 - 2023 මැයි මස 26 වැනි සිකුරාදා - 2023.05.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 338 |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 340 |


සැ. යු. - (i) බැංකු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2023 මැයි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ජුනි මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජුනි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


337- B 082457 — 353 (2023/05)
D I -

# පිස්කල් විකිණීම්

## අත්තනගල්ල දිසා අධිකරණය

### පිස්කල් වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය අංක 59 (01)(ආ) සහ 59(03) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

....................*පෙත්සම්කරු.*

නඩු අංකය : 624/විශේෂ
ස්වභාවය : විශේෂ
වටිනාකම : රු. 2,567,315/-

පිස්කල් ලිපිගොනු අංකය : 49/2019

*එදිරිව*

1. කරුණාගොඩ මුදලිගේ ප්‍රියන්ත කරුණාගොඩ, අංක 01/01, කණ්ඩලම, මීරිගම.
2. පැලවත්තේ අතුකෝරාලලාගේ නන්දන මුණසිංහ, අංක 21, දෙමටහැත්ත, මීරිගම.
3. දහනායක ජිමුත හේරත් දහනායක, අංක 32, දෙමටහැත්ත, මීරිගම.
4. පියදසගේ සිසිර ජයකොඩි, අංක 50/ඒ/81, බෙල්වුඩ් පාර්ක්, හපුගහගෙදර, ලෝලුවාගොඩ.

..................*වගඋත්තරකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ මෙම අධිකරණයේ 2019.09.24 දිනැති නියෝගය ප්‍රකාරව එකී නඩුවේ 01, 02, 03, 04 වන වගඋත්තරකරුවන්-ගෙන් පෙත්සම්කරුට අයවීමට ඇති රුපියල් විසිපන් ලක්ෂ හැටහත් දහස් තුන්සිය පහළොව (රු. 2,567,315/-) ක මුදල සහ එකී මුදල ගෙවා අවසන් වන තෙක් 2018.11.30 දින සිට මුල් මුදලට වාර්ෂිකව සියයට දහඅටක (18%) පොලියක් ද, ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් සහ එකී මුදල් නිසියාකාරව ගෙවා නොමැති බැවින් එකී මුදල මත නීතිමය පොලිය ද, නඩු ගාස්තු ද, ඇස්කීසි ගාස්තු සහ පිස්කල් ගාස්තු ද අයකර ගැනීම සඳහා වර්ෂ 2019.12.26 වැනි දින තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වගඋත්තරකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපලෙ හි ඔහුට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් ද,

**වර්ෂ 2023ක් වූ ජූලි මස 07 වැනි දින ප. ව. 2.30ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්,

(i) ගැණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ද,
(ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාරව නියෝජ්‍ය පිස්කල්තැනගේ ගාස්තු ද,
(iii) විකුණුම සඳහා වන සියලුම වියදම් ද,

මුදලින් ගෙවිය යුතුය.

තව ද, ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක් වන (75%) මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් හාපිටිගම් කෝරලේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 06 කණ්ඩලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කණ්ඩලම යන ගමේ පිහිටි ''මල්ලපොර කුඹුර *හෙවත්* පරගහකුඹුර'' යනුවෙන් හැඳින්වෙන ගොඩ මඩ ඉඩමට ඉරන්දතිස්ස කොටඹගේ බලයලත් මිනින්දෝරුතැන විසින් මැන සාදන ලද අංක 6038 සහ 2002.10.26 දිනත් දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 03 දරන කොටසට මායිම් : උතුරට - සී. වීරසිංහට අයිති ඉඩම ද, නැගෙනහිරට - ඇළ ද, දකුණට - රණසිංහට සහ තව අයට අයිති කුඹුර ද, බස්නාහිරට - ලොට් 01 දරන බිම් කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහතයි දශම අටයි බිංදුව (පර්. 17.80) ක් *හෙවත්* හෙක්ටයාර් 0.0450ක් විශාල ඇස්බැස්ටෝස් සෙවිලි කළ නිවස සහ ගසකොළ, පලතුරු ආදී සියලු දේ ද යන මෙකී දේපල වේ.

ඒ. එම්. කේ. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 2023ක් වූ මැයි මස 19 වැනි දින දී ය,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
අත්තනගල්ල, නිට්ටඹුව.

05-366

---

**අත්තනගල්ල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීම

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය අංක 59 (01)(ආ) සහ 59 (03) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

නඩු අංකය : 659/විශේෂ
ස්වභාවය : විශේෂ
වටිනාකම : රු. 6,670,982/-

.....................*පෙත්සම්කරු.*

පිස්කල් ලිපිගොනු අංකය : 19/2022

*එදිරිව*

1. රන්දුනු කල්පගේ සාලින්ද සංජය සිරිවර්ධන, අංක 311-සී, වඳුරාමුල්ල, අත්තනගල්ල.
2. හේවාපතිරණගේ චන්දන, අංක 01, ජය ශ්‍රී මාවත, බාඳුරාගොඩ, වේයන්ගොඩ.
3. පනාවල විදනලාගේ නොයෙල් ඩන්ස්ටන් පීරිස්, අංක සී/ඊ-1/15, රන්පොකුණගම, නිට්ටඹුව.

..................*වගඋත්තරකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ මෙම අධිකරණයේ 2020.08.24 දිනැති නියෝගය ප්‍රකාරව එකී නඩුවේ 01, 02 සහ 03 වන වගඋත්තරකරුවන්ගෙන් පෙත්සම්කරුට අයවීමට ඇති රුපියල් හැටහය ලක්ෂ හැත්තෑ දහස් නමසිය අසූ දෙකක (6,670,982/-) මුදල සහ එකී මුදල ගෙවා අවසන් වන තෙක් 2019.07.31 දින සිට මුල් මුදලට වාර්ෂිකව සියයට දහසයයි දශම හතයි පහක (16.75%) පොලියක් ද, ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් සහ එකී මුදල් නිසියාකාරව ගෙවා නොමැති බැවින් එකී මුදල මත නීතිමය පොලිය ද, නඩු ගාස්තු ද, ඇස්කීසි ගාස්තු සහ පිස්කල් ගාස්තු ද අයකර ගැනීම සඳහා වර්ෂ 2022.03.11 වැනි දින තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වන වගඋත්තරකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළෙ හි ඔහුට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් ද,

**වර්ෂ 2023ක් වූ ජූලි මස 14 වැනි දින ප. ව. 2.30ට එකී දේපල පිහිටි ස්ථානයේ දී** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්,

(i) ගැණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ද,
(ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට ප්‍රකාරව නියෝජ්‍ය පිස්කල්තැනගේ ගාස්තු ද,
(iii) විකුණුම සඳහා වන සියලුම වියදම් ද

මුදලින් ගෙවිය යුතුය.

තව ද, ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක් (75%) වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වඳුරාමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වඳුරාමුල්ල ගමේ පිහිටි දෙල්ගස්ඕවිට නමැති ඉඩමට, වරුණ අජන්ත යාපා බලයලත් මිනින්දෝරුතැන විසින් වර්ෂ 2016.03.16 වැනි දින මැන සාදන ලද අංක 5531 දරන පිඹුර ප්‍රකාර බෙදු වෙන් කළ ලොට් ඒ දරන කොටසට මායිම් : උතුරට - ඔය සඳහා රක්ෂිත බිම ද, නැගෙනහිරට : අංක 1951 පිඹුරේ කැබලි අංක 02 ද, දකුණට : පාර ද, බස්නාහිරට : ආර්. කේ. සංජය සිරිවර්ධන හිමිකම් කියන ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකක් (අ. 01) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ආකාරයට නැවත මැනීමක් කර ඇත :

වඳුරාමුල්ල ගමේ පිහිටි දෙල්ගස්ඕවිට නමැති ඉඩමට, වරුණ අජන්ත යාපා බලයලත් මිනින්දෝරුතැන විසින් වර්ෂ 2016.03.16 වැනි දින නැවත මැන සාදන ලද අංක 5531 දරන පිඹුර ප්‍රකාර බෙදු වෙන් කළ ලොට් ඒ දරන කොටසට මායිම් : උතුරට : ඔය සඳහා රක්ෂිත බිම ද, නැගෙනහිරට : අංක 1951 පිඹුරේ කැබලි අංක 02 ද, දකුණට : පාර ද, බස්නාහිරට : ආර්. කේ. සංජය සිරිවර්ධන හිමිකම් කියන ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකක් (අ. 01) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ. (මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 350/87 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.)

තව ද, ඉහත කී පිඹුරේ සඳහන් පොදු පාරේ මාර්ග අයිතිය ද සමග වේ.

ඒ. එම්. කේ. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 2023ක් වූ මැයි මස 19 වැනි දින දී ය,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, අත්තනගල්ල.

05-367

---

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ප්‍රේම්නාත් ශ්‍රී දොලවත්ත වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

1. ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරු සංගමය මගින් විනිසුරුවන් බඳවා ගැනීම, පුහුණු කිරීම සහ වැඩමුළු පැවැත්වීම,
2. ක්‍රිකට් තරග විනිශ්චය සඳහා විනිසුරුවන් යෙදවීම,
3. විනිසුරුවන් ශ්‍රේණිගත කිරීම, ඔවුන්ගේ සුභසාධන කටයුතු කිරීම සහ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට කටයුතු කිරීම,

යනාදිය වේ.

නීතිඥ ප්‍රේම්නාත් ශ්‍රී දොලවත්ත,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

05-294

## සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

2007 අංක 07 දරන සමාගම් පනතෙ හි 270 (අ) වගන්තිය සමග කියවිය යුතු වර්ෂ 1939 සමාගම් ඈවර කිරීමේ රීති පිළිබඳ විධි විධාන ප්‍රකාරව අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වන ඉල්ලීම පිළිබඳ කාරණාවේ දී ය.

ඔන්ඩ්රේ පෝල් සිවරාජා,
අංක 94/1,
7 පටුමග
මහල්වරාව, කොට්ටාව,
මහරගම.

නඩු අංකය : 11/2023/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

....................*පෙත්සම්කරු.*

*එදිරිව*

කම්ප්ලීට් ඉන්වෙස්ට්මන්ට්ස්,
(පුද්ගලික) සමාගම,
(Complete Investments (Pvt) Ltd.),
අංක 60, ගෝල් ෆේස් ටෙරස්,
කොළඹ 03.

..................*වගඋත්තරකරු.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් 2023ක් වූ පෙබරවාරි මස 08 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ධම්මිකා ජිමිනිගේ විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම සම්බන්ධයෙන් සමාගම වෙත නොතීසි නිකුත් කර වාර්තා 2023.05.31 වැනි දිනට කැඳවීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි දී පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන එකී සමාගමේ ඕනෑම ණය හිමියකුට හෝ සහදායකයකු ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් වන මා විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ධම්මිකා ජිමිනිගේ,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 16/G/9, කොස්හේන පාර,
මාලබේ.

***සටහන.-*** එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ධම්මිකා ජිමිනිගේ වන මා වෙත භාර දිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුය. එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන් ම 2023.05.30 වැනි දින සවස 6.00ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

05-295

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.